# මානව භාෂාවේ ස්වභාවය පිළිබඳ විමසුමක්

කළුබෝවිටියන සෝරත හිමි

## Abstract

Language is the most important feature that distinguishes human beings from other animal groups in the living world. We need language to carry out almost every activity in our society. It is not an ordinary part of human culture but the most important part. Language is an institution that should be taken as the basis of human culture. The source of language is the true beginning of humanity. That is the dawn of the world of knowledge. The immense progress that man has achieved so far is forever indebted to language. Among the products of man, language occupies an unrivaled place. Language is the guide of intelligence and the revolutionist of the fruit of intelligence. In this universe, language is more important than Yama. If these are the answers that can be said about language, who can not look for facts about it? Also, language is the most important and essential tool among the tools ever produced by man. Thus, human language can be described as the basic tool for building humanity. In particular, through this investigation, the study of the most unique creation of the human race, language. There, a systematic analysis is done by referring to scholarly books on the topics of what is language and what are the opinions of various scholars about it and what is the nature of human language.

**Key-words :** Language, human civilization, symbols, culture

ප්‍රමුඛ පද : භාෂාව, මානව ශිෂ්ටාචාරය, සංකේත, සංස්කෘතිය

## හැඳින්වීම

ලොව උපත ලබන සැම සත්වයෙක් ම තම තමන්ගේ හැඟීම් දැනිම් ප්‍රකාශ කිරීම සඳහා උපයෝගී කර ගන්නා ක්‍රමයක් තිබිය යුතු ය. මිනිසත් බව ලැබූ අප ද තිරිසන් බව ලැබූ සතුන්ට ද එය සර්ව සාධාරණ ය. මේ අතරින් භාෂාව මුල් තැනැක් ගනි. භාෂාව අපට ඉතා වැදගත් උපකරණයකි. භාෂ්-ව්‍යක්ත වචනාර්ථ ධාතුවෙන් නිෂ්පන්න වූ භාෂා යන කෘදන්ත පදය සිතෙහි අදහස් පැවසීමට ඉවහල් වන ශබ්ද සමූහය ස්වර-ව්‍යඤ්ජන වශයෙන් බිණීම යන අරුත ජනනය කරයි. මිනිසාගේ අවශ්‍යතා අතර ආහාර පාන ඇඳුම් පැළඳුම් වාසාස්ථාන මෙන් ම භාෂාව ද අපට වැදගත් වෙයි. මිනිස් ජීවිතයේ එදිනෙදා අවශ්‍යතා අති විශාල වන අතර මේ සියලු අවශ්‍යතා ඉටු කර ගැනීමට භාෂාව උපකාරී වේ.

මානව වර්ගයාගේ සුවිශේෂතම නිර්මාණය භාෂාවයි. තම සිතට දැනෙන හැඟීම් හා අදහස් අනෙකාට ප්‍රකාශ කිරීමට යොදාගත හැකි විචක්ෂණ ම මාධ්‍ය භාෂාව යි. සාමූහික ජීවිතය භෞතික මෙන් ම ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා සෘජුව ම බලපාන්නකි. භාෂාත්මක ආචරණ මගින් සාමුහික ජීවනය අර්ථවත් වේ. පෝෂණය වේ. මිනිස්සු එක් රොක් වී සමීප වී සුහදතා බැමි ජනිත කරගනිති. එමගින් සංවිධානාත්මක ශක්තිමත් සමාජයක් ගොඩනැගීමත් එකී සමාජය සජීවීව පවත්වා ගෙන යාමටත් හැකියාව ලැබේ. යම් හෙයකින් මිනිසාට මෙකී සුවිශේෂී ශක්‍යතාව නො වුයේ නම් සංකීර්ණ වූත් විසිතුරු වුත් නිර්මාණාත්මක වූත් සුන්දර ලෝකයක් බිහි නො වන්නට ඉඩ තිබුණි. ඒ අනුව මේ විචිත්‍ර වූ ලෝකයේ ගාමක බලවේගය අනෙකක් නො ව භාෂාව ම බව වටහා ගැනීම අපහසු නැත.

මිනිසා යමක් හේතු කොට ගෙන තම සිත තුළ උපන් අදහස් ප්‍රකාශ කෙරේ නම් එය භාෂාව නම් වේ. මානව ඉතිහාසයේ මිනිසා විසින් කරන ලද අතිවිශිෂ්ට නිර්මාණය ලෙස ද භාෂාව සලකනු ලැබේ. කුමක් නිසා ද යත් ලෝකයේ මිනිසුන් අතර සියලු අවශ්‍යතා සපුරා ගැනීම හා ලෝකයේ ප්‍රභවය භාෂාව නිසා සිදුවන බැවිනි. එහෙයින් ම පෙරදිග පඬිවරු භාෂාවේ ප්‍රසාදයෙන් ලෝක යාත්‍රාව පවතින්නේ යැයි ද යම්හෙයකින් ඒ ශබ්ද නැමැති ආලෝකය ලෝකයේ ව්‍යාප්ත ව

නො පවතී නම් එකල්හි මුළු ලෝකය ම සනාන්ධකාර වන්නේ යැයි කීය. මේ නිසා භාෂාව යනු සන්නිවේදනයේ අත්‍යවශ්‍ය අංගයක් බව අමුතුවෙන් කිව යුතු නො වේ.

නූතන වාග් විද්‍යාවේ ශිල්ප වදනක් ලෙස භාවිත වන භාෂණ යන්නට speech ලෙස ද භාෂාව යන්නට language ලෙස ද ඉංග්‍රීසියේ දී සමානාර්ථයෙන් යෙදේ. බිණීම, දෙඩීම, කථා කිරීම හා අරුත් සූචනය කරනු ලබන භාෂණයට මහෝපකාරී වන්නා වූ මෙවලම භාෂාව යි. 'භාෂතේ අනයේති භාෂා' වශයෙන් භාරතීය නෛරුක්තිකයන් විග්‍රහ කරන ලද්දේ ද මෙකී සංසිද්ධි ය යි. භාෂා සහ භාෂණ ශබ්දද්වය තුළ පවතින වෙනස පිළිබඳ ව නූතන වාග්විද්‍යාඥයෝ අවධානය යොමු කර ඇත. ඒ අනුව විසිවන සියවසේ පළමු දශකයේ දී ෆර්ඩිනන්දි සොසෙය්යෝ භාෂාව සම්බන්ධ අවස්ථා 03 ක් පෙන්ව යි.

- ල ලාංග්
- ල ලාංගාෂ්
- ල පරෝල්

සොසෙය්යෝ ල ලාංග් සංකල්පයෙන් අදහස් කරන්නේ භාෂාව යි. එනම් language වේ. සමාජ සංසිද්ධියක් වන භාෂාව ඕනෑ ම මනුෂ්‍ය සමාජයන් තුළ එකී මනුෂ්‍යය සමාජයේ සාමාජිකයන්ගේ සම්මුතිය තුළින් භාවිතයට ගැනීම සාමාන්‍ය සම්ප්‍රදාය යි. ඉංග්‍රීසි භාෂාව ප්‍රංශභාෂාව ජර්මන් භාෂාව ආදි වශයෙනි. ල ලංගාෂ් සංකල්පයෙන් අදහස් කරන්නේ මනුෂ්‍යය උප්පත්තියෙන් ම කිසියම් භාෂාවක් ග්‍රහණය කර ගැනීමට අවශ්‍ය ශක්‍යතාව පෙර දැරිව සිටීම යි. මිනිසාට සහජයෙන් ම ලැබෙන භාෂාමය ප්‍රවණතා එම සංකල්පයෙන් නිරූපණය වන බව ඒ. ජේ. ආර්. ෆර්ත් කියයි. ලා පරෝල් සංකල්පයෙන් අර්ථවත් වන්නේ භාෂාවක් ග්‍රහණය කර ගැනීමේ ශක්‍යතාවෙන් පරිපූර්ණ මිනිසා සමාජ සම්මුතිය තුළින් ඇති කර ගන්නා ලද භාෂාව මගින් භාෂණයේ යෙදීම යි. ඩේවඩ් ක්‍රිස්ටල්, නොම්චොම්ස්කි, ලෙනාඩ් බ්ලූම්පීල්ඩ් ආදිහු මේ පිළිබඳ අදහස් දැක් වූවෝ වෙති. මිනිසාගේ දෛනික ජීවිතයේ විවිධ කාර්යයන් ඉටුකර ගැනීමට සහ සෑම දෙනා අතරේ සුහදත්වය වර්ධනය කර ගැනීමට මෙන් ම සමස්ථ සමාජයේ සියලු කාර්යයන්

ඉටුකර ගැනීමට භාෂාවෙන් සිදු වෙන මෙහෙය ඉමහත් ය. භාෂාව යන්න කුමක් ද පිළිබඳ ව විවිධ නිගමනයන් ඉදිරිපත් කළ අය අතර උගතුන්ල විද්‍යාඥයන්, ශාස්ත්‍රඥයින්, දාර්ශනිකයන්, මනෝවිද්‍යාඥයන්, සාහිත්‍යධරයන්, ව්‍යාකරණඥයින් හා වාග් විද්‍යඥයින් යන අය ද වෙති. මොවුන් සැම දෙනාම භාෂාව පිළිබද ව අවධානය යොමු කර තිබෙන්නේ ඔවුනොවුන්ගේ විෂය පථයට අනුව ය. මේ නිසා මෙම මත එකිනෙකට වෙනස් ය. භාෂාව යන්න කුමක් දැයි හඳුන්වා දීම උදෙසා පඬිවරුන් ඉදිරිපත් කළ නිගමන රාශියක් පහත දැක් වෙයි.

- සාමාන්‍ය ව්‍යවහාරයට අනුව භාෂාව යන්නෙහි අදහස පුළුල් ලෙස සලකන විට මනුෂයන් ප්‍රධාන කොට ඇති සත්ත්ව වර්ගයා ඔවුන්ගේ හැඟීම් හා අදහස් ප්‍රකාශ කරන හෝ හුවමාරු කරගන්නා කවර ක්‍රමයකට වුව ද භාෂාව යැයි කිව හැකි ය.
- මනුෂ්‍යන් අතර හැඟීම් හා අදහස් ප්‍රකාශ කරන හෝ හුවමාරු කරගන්නා කවර ක්‍රමයකට වුව ද භාෂාව යැයි කිව හැකි ය.
- ක්‍රමවත් ලෙස පිළියෙල වූ ශබ්ද සංකේත සමුදාය භාෂාව යි.
- පොදු ව්‍යවහාරය මගින් ක්‍රමානුකූලව පිළියෙල වී සමාජ සම්මුතිය ලත් වාග්ශබ්ද සංකේත සමුදාය භාෂාව යි.
- ජනතාව අතර සම්බන්ධතාව ගොඩනගන ඉතා වැදගත් සමාජ බන්ධනය භාෂාව යි.
- මනුෂ්‍යයන් අදහස් හුවමාරු කරගන්නා ප්‍රධාන ම මාර්ගය භාෂාව යි.

ආගමික මතවාදයන්ට සීමා වී භාරතීය පැරණි භාෂාඥයන් ද භාෂා ප්‍රභවයන් ගැන කරුණු දක්වා තිබේ. එහෙත් පැරණි දාර්ශනිකයන් සහ නිදහස් චින්තකයන් භාෂා ප්‍රභවය ආදීනව අදහස් පවසා තිබේ. ඇරිස්ටෝටල්, එපික් යුරිස්, ප්ලේටෝ ආදින්ගේ කෘතීන්හි එන අදහස්වලින් ඒ බව හෙළිවේ. 18 19 සියවස්වල යුරෝපීය පඬිවරු අන් කවර කලටත් වඩා භාෂා ප්‍රභවයන් අරභයා ඉමහත් උද්යෝගයකින්

පර්යේෂණයන්හි මූලික ව ම නිරත වූහ. එහෙත් ප්‍රස්තුත ගැටලුවට නිෂ්චිත පිළිතුරක් සැපයීමට ඔවුන් සමත් නො වීය. පඬිවරයෙකු වූ තරපොරවාලා මෙතෙක් ලොව පහළ වූ වාග්විද්‍යාඥයින් භාෂා සම්භවය සෙවීමට වැය කළ කාලය හා ශ්‍රමය නිරර්ථක වී ඇත. පිළිගත හැකි නිගමනයක නිසැක ව ම එළඹීමට ඒ කිසිවෙක් සමත් නො වූහ. භාෂාවේ අගමුල සෙවීම අර්ථ ශූන්‍ය වෑයමක් බව මෙයින් තහවුරු වන්නේ ය.

භාෂාවේ ප්‍රභවය පිළිබඳ මෙතෙක් ඉදිරිපත් වී ඇති මතවාද ප්‍රධාන වශයෙන් දෙකොටසකට බෙදා දක්වා තිබේ.

I නිර්මාණවාදි මත

II පරිණාමවාදි මත

01- ලෝක මාපක දෙවියන් විසින් දුන් දායාදයක් ලෙස ඔවුන් විසින් බස හඳුන්වා දෙන ලදී. 'සංස්කෘත නාම දෛවී වාග් ප්‍රකෘති සංස්කෘතම්' යන යෙදුම්වලින් ඒ බව පැහැදිලි ය. 'සා මාගදි මූල භාෂා' මාගධිය මූල භාෂාව යැයි බෞද්ධයෝ කියති. හේමචන්ද්‍ර නැමැති ජෛන ආචාර්යවරයා සියලු භාෂාවන්ට මූල භූත වූයේ ප්‍රාකෘති ය යි කීය. හීබෲ ලොව මුල් ම භාෂාව ලෙස ක්‍රිස්තු භක්තිකයෝ සළකති.

02- භාෂාව පිළිබඳ ව නිර්මාණවාදී මත බැහැර කරන නූතන විද්‍යාඥයෝ පරිණාමවාදී මතයට ගරු කරති බස ක්‍රමික ව විකාශනය වූ බව පරිණාමවාදීන්ගේ පිළිගැනීම යි. මානවයා කායික හා ඓන්ද්‍රිය ශක්තියෙන් වර්ධනය වීමත් සමඟ ම අදහස් සහ හැඟීම් ප්‍රකාශ කිරීමේ හැකියාව ද ක්‍රමයෙන් දියුණු විය. පරිණාමවාදී මත පිරික්සූ මැක්ස්මුලර් පඬිවරයා ඒ සියල්ල සතර කොටසකට බෙදා දක්වයි.

01. බව් බව් න්‍යාය

02. ඩිං ඩොං න්‍යාය

03. පුහු පුහ් න්‍යාය

04. යෝ හෝහෝ න්‍යාය

තිරිසන් ගත සතුන් පවත්වන විවිධ හඬ අනුකරණය කිරීමට යාමෙන් මිනිස් බසේ උපත සිදුවන්නට ඇතැයි යන මතය ඉහත සඳහන් ප්‍රථම න්‍යාය යි. කාක්කා, කොරවක්කා, කොහා වැනි ඒ ඒ සතුන්ගේ හඬ අනුව භාෂාවට එක් වූ පදයි. මෙම මතය පිළිගත හොත් භාෂාවේ වචන කුරුලු කැදැල්ලෙන් ඔබ්බට නො යන බව මැක්ස් මුලර් පවසයි. ඝණ්ඨා නාදය බඳු විවිධ ශබ්ධ අනුකරණය කිරීම නිසා භාෂාවේ ප්‍රභවය සිදු වී යැයි මතය ඩිං ඩොං න්‍යායයි. ශාරීරික හා මානසික වේදනාවන් හට ගැනීම නිසා මිනිස් මුවෙන් නිරායාශයෙන් ම නිර්ගත පුහ් පුහ් - චිහ් චිහ් වැන් ශබ්ද අනුකරණය කිරිමෙන් බස හටගත් බව පැවසෙන න්‍යාය තුන්වැන්න යි. මිනිසුන් සාමුහික ව වැඩ කිරීම නිසා බලවත් කායික වෙහෙස නිවා ගැනීමට සචින්තකව නැගූ යේ හේ වැනි හඬ භාෂා උපතෙහි මූලාරම්භය ලෙස සැළකීම සිව්වන න්‍යාය යි. මේ අනුව භාෂාව පිළිබඳ නිර්මාණවාදී මතයට වඩා පරිණාමවාදී මතයෙහි විස්වාසයක් ගැබ්ව තිබෙන සෙයක් පෙනේ. මීට අමතර ව තවත් න්‍යාය දෙකක් වෙයි. එනම්

01. අංගවික්ෂේප න්‍යාය

02. මුඛවික්ෂේප න්‍යාය

ඒ අනුව ආදීම මිනිසුන් අදහස් ද හැඟිම් ද අන්‍යයන්ට ප්‍රකාශ කරන ලදදේ අංග චලනයෙන් ය. ඒ අංගවික්ෂේප න්‍යාය යි. අභිමත හැඟීම් හෙළි කිරීමට අංග චලනය කිරීමත් සමඟ නිරායාසයෙන් මුඛයෙන් නිර්මිත වචන දියුණු වීමෙන් බස උපන් බව අංගවික්ෂේප න්‍යායෙන් ප්‍රකාෂ වේ. මුඛ වික්ෂේප න්‍යාය ඉදිරිපත් කළ න්‍යායවාදියා නිර්මානවාදී මතය පළිගත්තෙකි. මේ න්‍යායට අනුව ආදිම මිනිසා හැඟීම් ප්‍රකාශ කළේ හස්ත චලනය මගින් ය. හස්ත චලනය අනුව තොල් සහ දිව ද චලනය වීම ස්වභාවික ය. මෙසේ හස්ත චලනය සහ මුව චලනය මගින් බසේ උපත සිදු වී ය යි ඉදිරිපත් කෙරෙන මතය මුඛ වික්ෂේපන්‍යාය යි.

භාෂා ප්‍රභවය ගැන මෙන් ම තත් මතවාදයන් ගැන ද සුවිශාල අවධානයක් යොමු කෙරෙන වාග්විද්‍යාව විසිවන සියවසෙහි ආරම්භයත් සමඟ ශීඝ්‍ර ලෙස දියුණුවන්නට විය. ජෙස්ර්සන, ඒ. එස්. ඩයමන්ඩ් වැනි වාග්විද්‍යාඥයෝ භාෂා ප්‍රභවය පිළිබඳ විවිධ පර්යේෂණ පැවැත්

වූහ. ජෙස්ර්සන් ඉහත දැක් වූ මතයන් ප්‍රතික්ෂේප කරයි. ඔහුගේ මතයට අනුව භාෂාව ප්‍රභවය වී ඇත්තේ මානව සමාජයේ ආදිමයන් අතර ලිංගික ආශාවන් මුල් කර ගෙන පහළ වූ ආදර හැගීම් හුවමාරු කර ගැනීමෙන් ය. මුල් අවධියෙහි ඔවුන් ගීතවත් ශබ්ද මාලාවක් භාවිත කරන්නට ඇතැයි ද ඔහු විශ්වාසය පළ කරයි. භාෂාවේ ප්‍රභවය ගැන ප්‍රකාශිත අන්‍ය මතයන් සියල්ල පිළිකෙව් කරන ඒ. එස්. ඩයමන්ඩ් බසෙහි උපත වැකිවලින් හටගත් බව කියයි. වැකියක් එක් වදනකින් පරිමිත විය. ළදරුවන් බස හසුරුවන හා හදාරන අන්දම සලකා බලා මෙම නිගමනයට ඔහු එළඹ ඇත.

ඉහත දී ආගමික මතවාද ඉදිරිපත් කළ අතර පැරණි ගීත දාර්ශනිකයන් නිදහස් චින්තකයන් වන ඇරිස්ටෝටල්, ප්ලේටෝ යන අයගේ කෘතිවල ද භාෂාවේ ප්‍රභවය ගැන කරුණු දක්වා ඇති බව පෙනී ය යි. වාග්විද්‍යා ඉතිහාසයෙහි 18, 19 වැනි සියවස්වල භාෂාවේ ප්‍රභවය පිළිබඳ පර්යේෂණ මෙන් ම වාද විවාද සම්බන්ධයෙන් මහත් ආන්දෝලනයකට තුඩුදුන් යුගයක් විය. එයට හේතුව අතීතයේ ඇති ව තිබූ නිර්මාණවාදී මත ඛණ්ඩනය කොට නවීන අදහසක් ඉදිරිපත් වීමයි. කෙසේ වූව ද මේ කිසිවෙකුටත් භාෂාවේ උපත පිළිබද නිශ්චිත තොරතුරක් අනාවරණය කර ගැනීමට නො හැකි වූහ.

ස්වභාව ධර්මයේ සියලු දේ වෙනස් වන සුලු වේ. භාෂාව ද එබදු ය. ජීව භාෂාවක් ඉතා ඉක්මනින් එබඳු වෙනස්වීම්වලට ලක් වේ. භාෂාවක තත්ත්වය අනුව මෙසේ වෙනස් වීම අඩු වැඩි වශයෙන් සිදු වෙයි. දියුණු සාහිත්‍යයක් ඇති සම්මත භාෂාවන් වෙනස් වීම ඉතා සෙමින් සිදු වේ. කථාවට පමණක් සිමා වූ එතරම් දියුණු මට්ටමක් නැති භාෂා ඉතා ඉක්මනින් ම වෙනස් වේ. මේ ආකාරයට වාග්විද්‍යාව භාෂාවේ ප්‍රභවය යනු කුමක් දැයි යන්න පිළිබඳ අවබෝධයක් ඉහත අධ්‍යයනය තුළින් ලබා ගත හැකි ය.

**මානව භාෂාවේ ස්වභාවය**

භාෂාව වනාහි මානවයා නිපද වූ විශිෂ්ඨතම මෙවලම යි. මානව ශිෂ්ටාචාරයේ ප්‍රගමනයට භාෂාවෙන් ලැබුණු පිටු බලය සුලුපටු නො වේ. මානවයාට පමණක් විශේෂිත වූ භාෂාවක් ග්‍රහණය කර ගැනීමට ඇති හැකියාව හෙවත් ශක්‍යතාව භේද කොට ගෙන මානව

භාෂාවේ නිෂ්පත්තිය කවදා කොතැනක සිදු වූව ද අන්‍ය සියලු ම භෞතික හා අභෞතික මානව නිර්මාණයන්ගේ පදනම භාෂාවක් භාවිත කිරීම නිසා සිදු වීම වැදගත් කොට සැලකිය යුතු කරුණකි.

Language is a system of signs that express ideas and is therefore comparable to a system of writing the alphabet of deaf. muts symbolic rites polite formulas military signals etc…… but it is the most important of all these systems.

භාෂා ශක්‍යතාවය පෙරදැරිව උපත ලබන මානවයා හට භාෂාව උරුම වන්නේ සංස්කෘතිය තුළිනි. මානවයා සතු චින්තන ශක්තිය මෙහෙයවා නිපදවා ගන්නා ලද භෞතික සහ අභෞතික සියල්ල නැතිනම් සියලු සත්ත්වයන් අභිබවා ස්වභාව දහම පාලනය කිරිම සඳහා බිහිවුණු සියල්ල සංස්කෘතිය වශයෙන් හඳුන්වනු ලබයි. සංස්කෘතිය සතු අංගෝපාංග වන ආගම නීති රීති සිරිත් විරිත් ඇගයීම් පාරම්පරික ඥාණ සම්භාරය සාහිත්‍ය ආදී සියල්ල භාෂාව මූලික වාහකය කර ගනිමින් ව්‍යවහාරයේ යෙදෙයි. කිසියම් ජාතියක් සතු භාෂාව තුළින් එකී ජාතියේ සංස්කෘතිය ඔවුන්ගේ අනන්‍යතාවේ ස්වභාවය හඳුනා ගත හැකි ය.

මානව භාෂාව පිළිබඳ ව විවිධ නිර්වචන ඇත. ඒවා තුළින් ප්‍රකට වන්නේ භාෂාවේ ස්වභාව ය යි. අන්‍ය භාෂාවන්ගෙන් මානව භාෂාව සුවිශේෂී වන ආකාරය පිළිබඳ ව යි. නිර්වචන හා භාෂාවේ ස්වභාවය ගැන අවධානය යොමු කිරීමේ දී එහි නියම ස්වභාවය දත හැකි ය. මෙහි ස්වභාවය විග්‍රහ කරන උගතුන් මේ සඳහා විවිධ නිර්ණායක භාවිත කරයි.

01. මනුෂ්‍ය භාෂාවේ ඇති විශේෂ සැලැස්ම

02. මනුෂ්‍ය භාෂාවේ ඇති නිර්මාණ ශක්තියෙන් යුක්ත වූ සන්නිවේදන උපක්‍රම

03. මනුෂ්‍ය භාෂාවේ ඇති අත්තනෝමතික භාවය

04. මනුෂ්‍ය භාෂාවකින් කියන දෙයට ප්‍රතිචාර වශයෙන් සිදුවන දේ කෙබඳු දැයි කිව නො හැකි වීම

05. මනුෂ්‍ය භාෂාවේ ඇති අර්ථ සංවිධානය පිළිබඳ ව විශ්ලේෂීකරණය.

06. මනුෂ්‍ය භාෂාවෙන් කළ හැකි විශේෂ කාරණයක් වන වියුක්ත ප්‍රකාශන කිරීමේ හැකියාව

07. එය ඉගෙන ගැනෙන්නේ ජන්ම උරුමයක් ලෙස නො ව සංස්කෘතික දායාදයන් වශයෙනි.''

මේ ආදි කරුණුවලින් එකිනෙකා අතර සන්නිවේදනය සඳහා යොදා ගන්නා මේ භාෂාව අතරින් මානව භාෂාව හා එය සතුන් අතරින් විශේෂ වන්නේ කෙසේ දැයි මැනවින් වැටහේ.

**භාෂාව ප්‍රබලතම සන්නිවේදන මාධ්‍යය වීමය**

මෙයින් පැහැදිලි කෙරෙන්නේ ලොව පවතින සන්නිවේදන මාධ්‍යයන් අතුරින් උත්කෘෂ්ට හා බලවත් පහසු සහ ස්ථිරසාර සන්නිවේදන මාධ්‍ය භාෂාව බව යි. ලොව නොයෙක් සන්නිවේදන මාධ්‍ය ඇත. ඒවා අතර නිර්මාණාත්මක සංකේත ප්‍රධාන තැනක් ගනී. මිනිසා අභිනයන් මගින් සන්නිවේදනය සිදු කරයි. මිනිසා කරනු ලබන සන්නිවේදනයෙන් 60%ක් පමණ ම මෙකී නිර්මාණමය සන්නිවේදනයට අයත් වේ. වාක්‍යමය සන්නිවේදනය 40%කි. මානව භාෂාව සතුව පවත්නා සුවිශේෂී ස්වභාවය වන්නේ එය ප්‍රබලතම සන්නිවේදන මාධ්‍ය වීම නිසා ය. භාෂාවේ මුඛ්‍යත ම අරමුණ සන්නිවේදන ය යි. එය මානවයා ඇතුළු සමස්ත සත්ත්ව වර්ගයාට අත්‍යවශ්‍ය අංගයකි. විශේෂත්වය වන්නේ මානව සන්නිවේදනය සත්ත්ව සන්නිවේදනයට වඩා ප්‍රබල ලෙස තත් කාර්යයේ යෙදීම යි. එයට හේතුව මානවයා විසින් නිපදවා ගන්නා ලද භාෂාව ඒ සඳහා යොදා ගැනීම යි. භාෂාව වාචික සන්නිවේදනය සඳහා ද අනෙකුත් සංඥා සංකේත අංග චලන ආදිය අවාක්‍ය සන්නිවේදනය සඳහා ද මිනිසා යොදා ගන්නා අතර එහි දී වුව ද ප්‍රබලත ම සන්නිවේදන මාධ්‍ය ලෙස භාවිත වන්නේ භාෂාව යි. ඊට අමතරව ස්පර්ෂක සන්නිවේදන මාධ්‍ය ද වැදගත් ය. එමෙන් ම ගඳ සුවඳින් ද සන්නිවේදනය කරයි. සකලවිධ නිර්වාෂ්‍යමය සන්නිවේදනය මගින් කෙරෙන්නේ ඉතා සීමිත පණිවිඩ ක්‍රමයකි. මේවා කෙතරම් තිබුණ ද මානව භාෂාව තරම් නම්‍යශීලී අවබෝධාත්මක

සන්නිවේදන මාධ්‍යයක් ලෙස ලොව නැත. මිනිස් සිතුවිලි චින්තනය හැඟීම් අන්‍යන්ට ප්‍රකාශ කරනුයේ භාෂාව මගිනි. පරම්පරාවෙන් දැනුම ඉදිරියට සම්ප්‍රේෂණය කෙරෙන්නේ මානව භාෂාව මගිනි. ඒ අනුව මානව භාෂාව උත්කෘෂ්ට සන්නිවේදන අංගයකි. එය අනෙක් ඒවාට වඩා විශේෂ වන්නේ එබැවිනි.

**සත්ත්ව භාෂාව හා මානුෂ්‍ය භාෂාවේ වෙනස**

මානව භාෂාවේ තවත් සුවිශේෂී ස්වභාවයක් වනුයේ සංස්කෘතික දායාදයක් ලෙස භාෂාව පුද්ගලයාට ලැබීමයි. මානුෂ්‍ය භාෂාවේ විශේෂතාව නම් එය ඉගෙන ගැනෙන්නේ ජන්ම උරුමයක් ලෙස නො ව සංස්කෘතික දායාදයක් ලෙස යි. සත්ත්ව භාෂා නිතර ම ජන්මයෙන් උරුම වන හැකියාවන් ය. කපුටු කූඩුව තුළ ඇති දැඩි වන කොවුල් පැටියා කෑ ගසන්නේ තමාට ජන්මයෙන් උරුම වූ කොවුල් බසිනි. එහෙත් දෙමාපියන්ගේ දරුවෙකු යම් හෙයකින් ඇස්කිමෝ පවුලක හැදුනොත් ඔහු බහතෝරන අවදියේ දී කතා කරනු ඇත්තේ තමා අවට භාවිත වන ඇස්කිමෝ භාෂාවෙනි. මන්ද මනුෂ්‍ය භාෂාවේ සංස්කෘතික වශයෙන් උරුම වන්නක් මිස ජන්මයෙන් උරුම වන්නක් බව යි.

භාෂාව සංකේත පද්ධතියකි. එනම් භාෂාවේ සංස්ථිතිය සැකසී තිබෙන්නේ ශබ්ධ පද වාක්‍ය වාක්‍යාංශ ආදියේ එකමුතුව යි. මේවා ඒ ඒ භාෂක සමාජයන් විසින් සම්මුතියෙන් ගෙන ඇති එකගතාවය මෙකී සංකේත භාෂක සමාජයෙන් සමාජයට වෙනත් මුහුණුවරක් ගන්නා සේ ම පොදුවේ සියල්ල සංකේත පද්ධතියක් ලෙස අර්ථ දැක්විය හැකි බව යි. උදාහරණ ලෙස අපි වාඩිවෙන ආසනයට පුටුව යැයි කියන්නා සේ ඉංග්‍රීසි ජාතිකයන් එය ජය්සර යන්නෙන් හැඳින්වයි. එසේ ම භාෂාව කිසියම් රටා පද්ධතියකින් සමන්විත වේ. මානවයා ළදරු භාෂා උද්ග්‍රහණ ක්‍රියාවලිය තුළ දී තමන්ට අදාළ භාෂක සමාජයේ භාෂා රටාව පිළිවෙළ ක්‍රමයෙන් අවබෝධ කර ගනී. ද්විතීයික අධ්‍යාපනය තුළ දී එය තව දුරටත් නිවැරදි ව භාවිත කරන ආකාරය හඳුනා ගනී. ශබ්ද සංයෝග වීම තුළ පද නිර්මාණය වේ. පද තුළින් වචන වාක්‍ය නිර්මාණය වේ. ඒවා එකිනෙකට ආවේණික රටා සමුදායකින් යුක්ත වේ.

මානව භාෂාවේ විශේෂ රීති පද්ධතියක් ඇත. භාෂාව රීති පද්ධතියකට අනුව හැඩ ගැසී ඇත. භාෂාවේ භාවිත පිළිවෙළ තීරණය කෙරෙන්නේ උක්ත රීති පද්ධතිය විසිනි. නිදසුනක් ලෙස උක්තාඛ්‍යාත සම්බන්ධය, අක්ෂර වින්‍යාසය දැක්විය හැකි ය. මේවා නිවැරදි ව නොයෙදී ම තුළින් විවිධ ගැටලු මතු විය හැකි ය. මේ අයුරින් බලන විට භාෂාව රීති පද්ධතියක් වේ. මනුෂ්‍ය භාෂාව එක් අතකින් අර්ථමය වශයෙනුත් අනික් අතින් ශබ්දමය වශයෙනුත් දෙයාකාරයට සැලසුම් වී පවතින බව සැලකිය යුතු ය. සෑම මනුෂ්‍ය භාෂාවක් ම ඊට විශේෂ වූ මූලික ශබ්ද කීපයකින් යුක්ත ව පවතී. එම මූලික ශබ්ද ඒකක එකතු වීමෙන් අර්ථ ප්‍රකාශ කරන පද සෑදී තිබේ. එසේ ම මානාව භාෂාව ක්‍රමානුකූල බවින් යුක්ත ය. එනම් එහි අදියර පහකි.

01. ශබ්ද

02. ශබ්දිම

03. පදිම පද

04. වාක්‍යය

05. අර්ථ

මෙම සැලැස්ම සියලු මානව භාෂාවන්ට පොදුවේ සෑම මානව භාෂාවක මෙම විධිමත් ව්‍යූවහයක් තිබෙන බව පැහැදිලි ය. එසේ ම මානව භාෂාවේ තවත් සුවිශේෂී ලක්‍ෂණයක් නම් එහි තිබෙන විශිෂ්ට නිර්මාණකරණය හා නවීකරණය කිරීමේ කුසලතාව ය යි. එය විශේෂ ස්වභාවයකි. නව ආලාප වාගාලාප ජනනය කළ හැක්කේ මානව භාෂාවට ම පමණි. නිර්මාණකරුවා සියදහස් ගණන් නව ආලාප ජනනය කරයි. නීල් ආම්ස්ට්‍රොන් හදට යෑම වැනි දේවල් උදාහරණ ය.

### අක්ෂර වර්ණ හා ශබ්ද

අක්ෂර යනු වැය නො වන ක්ෂය නො වන බැවිනි. එමෙන් ම අක්ෂර හා ශබ්ද එකිනෙකට සමාන බව මීමංසිකයෝ ප්‍රකාශ කරති. එම හේතුව කරණ කොට ගෙන අකුරුවලින් සංගෘහිත දෙය පදයක් බවට පත් වේ. ඒ බව (වර්ණා එවතු ශබ්ද ඉති භගවානුපවර්ෂා,ශභර භාෂය) යනුවෙන් දැක් වේ.

**පද**

අක්ෂරවලින් වෙන් වූ කිසිවක් පද ලෙස ගත නො හැකි බව පැහැදිලි වේ. එයට නිදසුනක් ලෙස පහත පාඨය පෙන්වා දිය හැකි ය. (අථො න කෙභ්‍යො වර්ණේභ්‍යො ව්‍යතිරිත්තම් අන්‍යත් පදම් නාම, ශබර භාෂය 1,1,5) වර්ණවලින් වෙන් වූ කිසිවක් පද ලෙස ගත නො හැකි ය, යනු එහි අර්ථ ය යි. මීට අමතර ව නාගේෂභට්ඨයන්ගේ ලඝුමංජුසා නම් කෘතියේ දැක්වෙන පරිදි උපසර්ග නාම ආදි අර්ථවත් සියල්ල ම පද වශයෙන් ගත් බව පැහැදිලි වේ. තවත් මතයක් මීමංසිකයෝ ප්‍රකාශ කර සිටිති. එනම් අර්ථය පදයක ලක්ෂණයක් බව පිළිගැනීමට අකමැති වීම ය.

**අඛණ්ඩවාක්‍යවාදය**

අඛණ්ඩවාක්‍යවාදය යනු වාක්‍යක නො බෙදිය හැකි බව ය. මෙම මතය ඉදිරිපත් කරනු ලබන්නේ භර්තෘහරි විසිනි. භාෂාවේ කුඩා ම අර්ථවත් ම ඒකකය වාක්‍ය ලෙස ඔහු පෙන්වා දෙයි. කථනයේ දී අප කථා කරන සෑම වාක්‍යක් ම සෑම වචනයක් ම සම්පූර්ණ වාක්‍යයක් ලෙස ඔහු පෙන්වා දෙයි. එම හේතුව නිසා භාෂාවේ දී අප කතා කරනුයේ වාක්‍ය පමණි. ඒ අනුව ඕනෑම භාෂාවක තිබෙන අර්ථවත් ප්‍රකාශන සියල්ල ම සම්පූර්ණ වාක්‍යයක් බව පෙන්වා දෙයි.

**ශබ්දාද්වෛතවාදය**

වාක්‍යපදිය රචනා කරන්නට යෙදුණු භර්තෘහරි විසින් සාකච්ඡා කරන භාෂාව විග්‍රහ කොට ඇත්තේ මේ නමින් ය. එයට හේතුව නම් ශබ්දය හෙවත් බ්‍රහ්මන් ලෙස හඳුන්වා එය නො බෙදිය හැකි ඒකකයක් බවට පවසා ඇති හෙයිනි. අනතුරුව භර්තෘහරි විසින් ශබ්දය බ්‍රහ්මන් ලෙස සලකා ශබ්ද බ්‍රහ්මන් ලෙස විවරණය කොට ඇත. එමෙන් ම ව්‍යාකරණය මගින් හෙළි කරන ලද පද, වාක්‍ය, ධාතු ආදි බෙදීම් ව්‍යාජ හා තාවකාලික බෙදීම් ලෙස ඔහු විසින් පෙන්වා දෙනු ලබයි. තව ද මෙම ශබ්ද බ්‍රහ්මන් සංකල්පය සදාතනික හා අනවසාන ක්‍රියාවලියක් ලෙස ද විග්‍රහ කර දක්වා ඇත. මෙම ශබ්ද බ්‍රහ්මන් සංකල්පයට අමතර ව පර බ්‍රහ්මන් නමැති සංකල්පයක් ද අද්වෛත දාර්ශනිකයෝ පෙන්වා දෙති. ඔවුන් විසින් එය විවරණය

කරනු ලබන්නේ ශබ්ද බ්‍රහ්මති නිර්ණාතඃ පර බ්‍රහ්මාධිගච්ඡති යනුවෙනි.

මේ අනුව ඉහත තොරතුරුවලින් පැහැදිලි වනුයේ භාෂාව සුවිශේෂී ගති ස්වභාවලින් යුත් විශිෂ්ටතම මානව නිර්මාණයක් බවයි. එසේ ම මානව භාෂාව තුළ තිබෙන ස්වභාවයන් අනෙක් මාධ්‍යය තුළ නැත. මෙසේ බලන කල මානව භාෂාව අනෙකුත් සියලු ම සන්නිවේදන මාධ්‍යයන්ට වඩා විශිෂ්ට ව්‍යුවහයකින් ද උත්කෘෂ්ඨ ලක්ෂණ ස්වභාවයකින් සුසැදුනු අද්විතීය ලක්ෂණයන්ගෙන් යුතු පද්ධතියක් බව හඳුනා ගත හැක.

## නිගමනය

මනුෂ්‍යයා විසින් මෙතෙක් නිපදවන ලද හෝ අනාවරණය කරන ලද උපකරණ අතුරින් ඉතා වැදගත් වූත් අත්‍යාවශ්‍ය වූත් උපකරණය භාෂාව යි. ඒ මනුෂ්‍යාගේ දිවිපැවැත්මට උවමනා ආහාරපාන, වාසාස්ථාන, ඇඳුම් පැළඳුම් සැපයීමේ දී පමණක් නො ව ජීවිතය හැඩ ගැස්වීමේ දී ද අන් හැම උපකරණයකට ම වඩා වැදගත් තැනක් ගනී. භාෂාව මනුෂ්‍යත්වය ගොඩනැගීමේ මූලික උපකරණය වශයෙන් හැඳින් වූයේ මේ නිසා ය. මානව භාෂාව පිළිබඳ ව අධ්‍යනය කිරීමේ දී වඩාත් වැදගත් වන සාධකය නම් මානව භාෂාව පිළිබඳ ව කරනු ලබන ශස්ත්‍රීය හැදෑරීම යි. ඒ අනුව මෙම විමර්ශනය තුළ දී මානව භාෂාව පිළිබඳ ව විද්වත් නිර්වචන, මානව භාෂාවේ ප්‍රභවය හා විකාශනය පිළිබඳවත් එහි ස්වාභාවය පිළිබඳවත් ශාස්ත්‍රීයව අධ්‍යයනය කරන ලදි. එමගින් ගම්‍ය වූයේ අන් භාෂාවන්වලට වඩා මානව භාෂාව සුවිශිෂ්ට භාෂාවක් වන බවයි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

කරුණාතිලක, ඕ.එන්. (2010). ***භාෂා සමීක්ෂා.*** කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ගුණසේකර, සෝමපාලග (1968). **භාෂාවක ප්‍රාතිහාර්ය.** වැලිගම: ජනිත මුද්‍රණාලය.

ජයසේකර, ආනන්ද සහ ජයසේකර, චිත්‍රා (1970). **තුලනාත්මක වාග් විද්‍යාව.** කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයො.

දිසානායක, ජේ.බී (2005). **මානව භාෂා ප්‍රවේශය.** කලුබෝවිල: සමිත ප්‍රකාශකයෝ.

ධර්මදාස, කේ.එන්.ඕ (1989). **භාෂාවේ සම්භවය හා සංස්කෘතිය**. කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

බලගල්ලේ, විමල් ජී (2001). **භාෂා අධ්‍යනය හා සිංහල ව්‍යවහාරය**. කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

වසන්ත,කේ. දිසානායක. (2010). **භාෂාව හා භාවිතය**. පේරාදෙණිය: නෙත්වින් මුද්‍රණාලය.

විමලවංශ හිමි, බද්දේගම (1950). **බෞද්ධ සාහිත්‍ය**. කොළඹ: අනුර මුද්‍රණාලය.

විමලවංස හිමි, බද්දේගම (1957). **සිංහල භාෂා පරිණාමය**. කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

සුමනජෝති හිමි, පල්ලත්තර (1966). **වාග් විද්‍යාත්මක සිංහල ව්‍යාකරණය**. කොළඹ : වැහිහෙනේ පඤ්ඤාලෝක ස්වභාෂා මුද්‍රණාලය.

සෝරත හිමි, වැලිවිටියේ (1970). **ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය** (සිංහලාර්ථ සංස්)ද්විතීය භාගය. ගල්කිස්ස: අභය ප්‍රකාශන, දෙවන මුද්‍රණය.